## 2022 මාර්තු මාසයට අදාලව 2022.03.22 දින පවත්වන ලද බිබිල ප්‍රාදේශීය සභාවේ මාසික සභා රැස්වීමේ වාර්තාව.

**දිනය** - 2022.03.22
**වේලාව** - පෙ.ව. 9.30
**ස්ථානය** - බිබිල ප්‍රාදේශීය සභාවේ සභා රැස්වීම් ශාලාව.

**සහභාගීත්වය -**

| | |
|---|---|
| 01. ජී.ජී.ආර්. සිල්වා මැතිතුමා | - ගරු සභාපති |
| 02. එස්.ඒ.එම්. චන්ද්‍රසේකර බණ්ඩා මැතිතුමා | - ගරු උප සභාපති |
| 03. ඒ.එම්. සුදුනිලමේ මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 04. එම්.ඒ. උබේසේන මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 05. බී. විල්මට් සිල්වා මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 06. කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 07. ඒ.එම්. නදීශා ජයමිණී ගුණසේකර මැතිතුමිය | - ගරු මන්ත්‍රිණී |
| 08. කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 09. එල්.ඒ.බී. චන්ද්‍රිකා මල්කාන්ති මැතිතුමිය | - ගරු මන්ත්‍රිණී |
| 10. ඩී.එම්. කරුණාවතී මැතිතුමිය | - ගරු මන්ත්‍රිණී |
| 11. ජේ.ඒ. අමාලි කාංචනා ජයලත් මැතිතුමිය | - ගරු මන්ත්‍රිණී |
| 12. ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 13. ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 14. එච්.එම්. සරත් කුමාර මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 15. එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා | - ගරු මන්ත්‍රී |

**පසුගිය මාසයේ සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීම.**

2022.02.22 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව ගරු මන්ත්‍රීතුමන්ලා වෙත 2022.03.15 වන දින මා විසින් යොමුකර ඇති බැවින් එම වාර්තාව මෙම සභාවේ කියවූවා සේ සලකා වාර්තාව සභා සම්මත කර ගන්නා ලෙසත් වාර්තාවේ සංශෝධන කිසිවක් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙසත් ගරු සභාපතිතුමා සභාවට දන්වන ලදි.

එහිදි ගරු මන්ත්‍රි කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා පසුගිය මස සභා වාර්තාව සභා සම්මත කිරීමේ යෝජනාව ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රි බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් 2022.02.22 දිනැති සභා වාර්තාව සභා සම්මත විය.

### 02. ගරු සභාපතිතුමා විසින් කරනු ලැබූ විශේෂ නිවේදන.

### 2.1. 2022 පෙබරවාරි මාසය තුල කොවිඩ් ප්‍රතිකාර මෙහෙයුම් මධ්‍යස්ථානය සම්බන්ධ වාර්තාව .

2022 පෙබරවාරි මාසය තුල බිබිල ප්‍රදේශය තුල වාර්තාවූ ලෙස කොවිඩ් ආසාධිත රෝගීන් ප්‍රමාණය සැලකිය යුතු අඩුවිමක් දක්නට ලැබුන අතර බිබිල සෞඛ්‍ය නිලධාරි කාර්යාලය හරහා ලැබුණු වාර්තාවන්ට අනුව නිවෙස් වල නිරෝධායනය වන රෝග ලක්ෂණ සහිත ආසාධිත කොවිඩ් රෝගීන් හට අවශ්‍ය ආයුර්වේද ඖෂධ හා ප්‍රතිශක්ති වර්ධක ඖෂධ ඔවුන්ගේ නිවෙස් වෙතටම ලබා දීම අඛණ්ඩව සිදු කරන ලදී. එම රෝගීන්ගේ ලේඛනය පහත දැක්වේ.

| දිනය | රෝගීන් ප්‍රමාණය |
|---|---|
| 2022.02.07 | 21 |
| 2022.02.09 | 03 |
| 2022.02.10 | 12 |
| 2022.02.14 | 08 |
| 2022.02.28 | 05 |
| **මුළු එකතුව** | **49** |

පුද්ගල ශරීරය තුල ප්‍රතිශක්තිය ආරක්ෂා කිරීම හා වර්ධනය කිරීම අරමුණු කරගෙන පෙබරවාරි මාසය තුලද පමණක් සුවධරණී පේයාව බෙදා දෙන ලදී. බිබිල ප්‍රාදේශීය සභා ආයුර්වේද බෙහෙත් ශාලාවේ පැවැත්වෙන කොවිඩ් පසු ප්‍රතිකාර සායනය හරහා කොවිඩ් ආසාධිතව නියමිත නිරෝධායන කාලය අවසන් වූවද විවිධ වූ අතුරු ආබාධවලින් පෙලෙමින් සිටින රෝගීන් හට තව දුරටත් ප්‍රතිකාර ලබා දෙන බව නිවේදනය කළේය.

## **2.2. පළාත් පාලන දේශපාලන ක්‍රියාවලිය තුළ කාන්තා සහභාගිත්වය ශක්තිමත් කිරීම සම්බන්ධවයි.**

පළාත් පාලන දේශපාලන ක්‍රියාවලිය තුළ කාන්තා සහභාගිත්වය ශක්තිමත් කිරීම සඳහා විශේෂ ව්‍යාපෘතියක් ආරම්භ කර ඇති බවත්, ඒ සඳහා ප්‍රාදේශීය සභා මට්ටමින් දැනුවත් කිරීමේ සංවාද මාලාවක් පැවැත්විය යුතු බවත් ,එය 2022.04.04 දින රිදීමාලියද්ද ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරයේදී පැවැත්වෙන වැඩසටහන සඳහා ගරු උපසභාපතිතුමා ඇතුළු සියළුම මන්ත්‍රීවරියන්ට සභා ලේකම් සමඟ සහභාගි වන ලෙස නිවේදනය කළේය.

## **2.3. වීථි ලාම්පු නිවා දැමීම සම්බන්ධවයි.**

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් ලිපියක් ඉදිරිපත් කරමින් රටේ පවතින විදුලි අර්බුදය නිසා අනවශ්‍ය වීථි ලාම්පු ඉවත් කිරීම සිදු කිරීම , වීථි ලාම්පු දැල්වෙන කාලය දිනයක ප.ව.7.00 සහ පසු දින පෙ.ව.5.00 දක්වා පමණක් බව දන්වා ඇති අතර ඔබ ප්‍රදේශයේ සිටින ජනතාව මේ පිළිබඳ දැනුවත් කරන ලෙසත් අනවශ්‍ය ලෙස විදුලිය භාවිත කරන පුද්ගලයන්ට අවවාද කර එසේත් නොකරන්නේ නම් එවැනි වීථි ලාම්පු ගලවා ඉවත් කිරීමට බලාපොරොත්තුවන බව නිවේදනය කළේය.

## **2.4. මහමෙව්නාව භාවනා අසපුව පිළිබඳ සිදු කරනු ලබන අසත්‍ය ප්‍රචාරනයන් සම්බන්ධවයි.**

බුද්ධ ශාසනයේ අභිවෘද්ධිය පිණිස සුවිශාල සේවාවන් රැසක් ක්‍රියාත්මක කරනා වැදගත් බෞද්ධ ආගමික ආයතනයක් වන මහමෙව්නාව භාවනා අසපුවේ කීර්ති නාමයට හානි වන අයුරින් ඌව පළාතේ විහාරස්ථාන හා රාජ්‍ය ආයතන නොමඟ යවමින් කිසියම් ධර්ම විරෝධී පුද්ගලයන් විසින් අසත්‍ය ප්‍රචාර සිදු කරගෙන යන බව බිබිල මහමෙව්නාව භාවනා අසපුවෙහි පූජ්‍ය බැදිගම ධම්මාවාස ස්ථවිර ස්වාමින් වහනසේ විසින් අප වෙත දැනුම් දී ඇති බැවින් මෙය නිවැරදි නොවන මතයක් බව ජනතාවද දැනුවත් කරන ලෙස ගරු මන්ත්‍රී මණ්ඩලයට නිවේදනය කළේය.

## 03.ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම.

ගරු මන්ත්‍රිනී ඩී.එම්. කරුණාවතී මැතිතුමිය

01.බිබිල, උණගොල්ල, 15/C ලිපිනයෙහි පදිංචි ඩී.එම්.ගුණසේන මහතා විසින් රත්නවත්ත සිට බමුණා පතනා දේවාලේ කුඹුරු හරහා කහටගහවත්ත දක්වා මාර්ගය කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කර දෙන මෙන් ඉල්ලමින් ඉදිරිපත් කර තිබූ ලිපිය ගරු මන්ත්‍රිනී ඩී.එම්. කරුණාවතී මැතිතුමිය විසින් සභාගත කරන ලදි.

02.බිබිල,උණගොල්ල,බැදියාකිවුල පාර,අංක 08 ලිපිනයෙහි පදිංචි කේ.එච්.එම්.කරුණාපාල මහතා විසින් නියං සමයේදී ජලය ලබා ගැනීමට අපහසු බැවින් එයට පිළියමක් ලබා දෙන මෙන් ඉල්ලමින් ඉදිරිපත් කර තිබූ ලිපිය ගරු මන්ත්‍රිනී ඩී.එම්. කරුණාවතී මැතිතුමිය විසින් සභාගත කරන ලදි.

**ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා**

බිබිල, නිල්ගල, හමනව ලිපිනයෙහි පදිංචි එච්.එම්.චන්ද්‍රපාල මහතා විසින් හමනව මාර්ගය මෝටර්ග්‍රේඩර් කර දෙන ලෙස ඉල්ලමින් ඉදිරිපත් කර තිබූ ලිපිය ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සභාගත කරන ලදි.

## 04.යථාපරිදි කල්දී ඇති ප්‍රශ්න.

කිසිවක් ඉදිරිපත් වී නොමැත.

## 05.යථාපරිදි කල්දී ඇති යෝජනා.

## 05.01.ගරු සභාපති ජී.ජී.ආර්. සිල්වා මැතිතුමාගේ යෝජනා.

## 05.01.01. දොඩම්ගොල්ල කඩ කාමර සඳහා 2021 වර්ෂයේ බදු මුදල් ගෙවීම සම්බන්ධවයි.

2022.02.22 දින අංක 05.01.19 සභා තීරණය අනුව දොඩම්ගොල්ල කඩ කාමර 03 හි සියලුම බදු මුදල් කපා හැරීමට තීරණය කර ඇත. මෙම කඩ කාමර සඳහා මාසික කුලී මුදල රු 2500.00 කි. මෙම කඩ කාමර තුනට අදාලව කඩ කාමර කුලී මුදල් අඩු කර දෙන ලෙස මීට පෙර ඉල්ලීම් කර ඇත. එම බදුකරුවන් වන

අංක 01 කඩ කාමරය ඒ. එම් තරිඳු ලක්ෂිත අත්තනායක

අංක 02 කඩ කාමරය ඒ. එම් ටී. එල් අත්තනායක

අංක 03 කඩ කාමරය ඒ. එම් සුදුනිලමේ

යන අය 2021 වර්ෂයේ මැයි 21 සිට ජුනි 21 දක්වා කොවිඩ් හේතුවෙන් රට වසා තිබූ කාලයට හා 2021 අගෝස්තු 20 සිට සැප්තැම්බර් 30 දක්වා කොවිඩ් හේතුවෙන් රට වසා තිබූ කාලයට කුලී මුදල් අඩු කර සහන සලසා දෙන ලෙස ඉල්ලීම් කර ඇත. (එම ලිපිවල ඡායා පිටපත් අමුණා ඇත.) එම ඉල්ලීම් අනුව එම කාලයට අදාල කුලී මුදල් අඩු කර ඇත.

කොවිඩ් පැවති කාලයට කුලී මුදල් අඩු කර දෙන ලෙස පෙර ඉල්ලීම් කර නැවත වරක් සම්පූර්ණ කුලී මුදල් අඩු කර දෙන ලෙස ඉල්ලීම ගැටළු සහගත බැවින් මෙම කරුණ සම්බන්දව විගණන විමසුමට ලක්විය හැකි බව සඳහන් කරමි. එසේම බදුකරුවන් විසින් පෙර

ඉල්ලීම් කර තිබූ පරිදි එක් එක් කඩ කාමරය වෙනුවෙන් වෙන වෙන ම ඉල්ලීම් කළ යුතුය වේ.

මෙම කඩ කාමර සඳහා දැනට අය වීමට ඇති හිඟ කුලී මුදල් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| කඩ කාමරය | බදුකරුගේ නම | කාලය | කුලී මුදල |
|---|---|---|---|
| අංක 01 කඩ කාමරය | ඒ. එම් තරිඳු ලක්ෂිත අත්තනායක | 2021 ජනවාරි සිට නොවැම්බර් | 21,666.67 |
| අංක 02 කඩ කාමරය | ඒ. එම් ටී. එල් අත්තනායක | 2021 ජනවාරි සිට නොවැම්බර් | 21,666.67 |
| අංක 03 කඩ කාමරය | ඒ. එම් සුදුනිලමේ | 2021 ජනවාරි සිට නොවැම්බර් | 21,666.67 |

2021 ජුනි සැප්තැම්බර් මාස සඳහා කුලී මුදල් අඩු කර ඇති අතර 2021 අගෝස්තු මාසය සඳහා දින 20 ක් සඳහා පමනක් බිල් කර ඇත. 2021 දෙසැම්බර් මස කඩ මුද්‍රා තැබූ බැවින් දෙසැම්බර් මාසය සඳහා බිල්කර නැති බැවින් මේ පිළිබඳ සාකච්ඡා කර තීරණයක් ගැනීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහිදී 2021 වර්ෂයේ අතරමැද මාසවලදී විටින් විට ගෙවීම් කර ඇති නිසා 2021 වර්ෂයට අදාල සම්පූර්ණ බදු මුදල කපා හැරීම පිළිබඳ ගැටළුවක් ඇති බවත් මේ පිළිබඳ තවදුරටත් විස්තර කිරීමට ගරු සභාපතිතුමා විසින් ලේකම්තුමාට ආරාධනා කළ අතර එහිදී ලේකම්තුමා විසින්ද වර්ෂයේ අතරමැදදී ගෙවීම් කර ඇති නිසා සම්පූර්ණ බදු මුදල කපා හැරීම ගැටළුවක් බව පෙන්වා දුන් අතර සෑම දෙනාටම සමසේ සැලකිය යුතු බවත් තව දුරටත් පැවසූ අතර ඒ. එම් සුදුනිලමේ මන්ත්‍රීතුමා අසනීප තත්වයෙන් පෙලීම නිසා 2022 දෙසැම්බර් මසට පෙර අදාල බදු මුදල වන රු. 21,666.67ක මුදල අය කර ගැනීමටත් අනෙක් බදුකරුවන් වන ඒ. එම් තරිඳු ලක්ෂිත අත්තනායක හා ඒ. එම් ටී. එල් අත්තනායක යන අයගෙන් රු. 21,666.67 බදු මුදල වෙ වෙනම 2022 ජුනි මාසයට පෙර අය කර ගැනීමටත් ඒ පිළිබඳ ඔවුන්ව ලිපි මගින් දැනුවත් කිරීම සුදුසු බවත් සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ඒ. එම් සුදුනිලමේ මන්ත්‍රීතුමා අසනීප තත්වයෙන් පෙලීම නිසා 2022 දෙසැම්බර් මසට පෙර අදාල බදු මුදල වන රු. 21,666.67ක මුදල වෙන වෙනම අය කර ගැනීමටත් අනෙක් බදුකරුවන් වන ඒ. එම් තරිඳු ලක්ෂිත අත්තනායක හා ඒ. එම් ටී. එල් අත්තනායක යන අයගෙන් රු. 21,666.67 බදු මුදල 2022 ජුනි මාසයට පෙර අය කර ගැනීමටත් ඒ පිළිබඳ ඔවුන්ව ලිපි මගින් දැනුවත් කිරීම සුදුසු බවටත් තීරණය විය.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.
එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.02.වොලිබෝල් කණූ හා ආලෝක විදුලි පහන් (ප්ලැෂර් ලයිට්) ලබා ගැනීම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාවෙන් 2022 වර්ෂයේ සිංහල අලුත් අවුරුද්ද නිමිති කොටගෙන පවත්වනු ලබන වොලිබෝල් තරගාවලිය සඳහා අවශ්‍ය වොලිබෝල් කණූ සහ රාත්‍රී කාලයේ දී ක්‍රීඩා කිරීමට අවශ්‍ය ආලෝක පහන් (ප්ලැෂර් ලයිට්) දැනට සභාව සතුව නොමැති බැවින් ඒ සඳහා අවශ්‍ය වොලිබෝල් කණූ දෙකක් හා ආලෝක පහන් (ප්ලැෂර් ලයිට්) මිල දී ගැනීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.
අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

බිබිල යසෝධරා බාලිකාව පාසල අසල ඇති ක්‍රීඩාපිටිය බිබිල ලේකම් කාර්යාලය මඟින් ප්‍රාදේශීය සභාවට පවරා දුන් පසු එහි නඩත්තුව හා පරිපාලනය කිරීම ප්‍රාදේශී සභාව සතු වන බැවින් 2022 වර්ෂයේ අප්‍රේල් මාසයේ පැවැත්විමට නියමිත දිවා රාත්‍රී වොලිබෝල් අවසන් තරඟය මෙම ක්‍රීඩාංගනයේ දී පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇති අතර ඒ සඳහා අවශ්‍ය වොලි බෝල් කණූ දෙකක් සහ ආලෝක පහන් (ප්ලැෂර් ලයිට්) අවශ්‍ය බැවින් ඒ සඳහා රු.369,000.00ක මුදලක් වැය වන බවත් එය මිලදී ගැනීම සුදුසු බවත් සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

බිබිල බාලිකාව පාසල අසල ඇති ක්‍රීඩාපිටිය බිබිල ලේකම් කාර්යාලය මඟින් ප්‍රාදේශීය සභාවට පවරා දුන් පසු එහි නඩත්තුව හා පරිපාලනය කිරීම ප්‍රාදේශී සභාව සතු වන බැවින් 2022 වර්ෂයේ අප්‍රේල් මාසයේ පැවැත්විමට නියමිත දිවා රාත්‍රී වොලිබෝල් අවසන් තරඟය මෙම ක්‍රීඩාංගනයේ දී පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇති අතර ඒ සඳහා අවශ්‍ය වොලි බෝල් කණූ දෙකක් සහ ආලෝක පහන් (ප්ලැෂර් ලයිට්) අවශ්‍ය බැවින් ඒ සඳහා රු.369,000.00ක මුදලක් වැය වන බවත් එය මිලදී ගැනීම සුදුසු බවත් තීරණය විය.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.
එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.03.මෝටර්ග්‍රේඩරය,බැකෝලෝඩරය හා ගල්රෝල කුලියට දීමේ ගාස්තුව වැඩි කිරිම සම්බන්ධවයි.

මෙතෙක් කලක් බිබිල ප්‍රාදේශීය සභාව සතු මෝටර්ග්‍රේඩරය හා බැකෝලෝඩරය කුලියට දීමේ දී මීටර් පැයක් සඳහා අය කරන ලද ගාස්තුව රු.4,000.00ක් හා රු.3,000.00ක් වූ අතර පසුගියදා අසීමිත ලෙස ඉන්ධන මිල ඉහල යාම හේතුකොටගෙන තවදුරටත් ඉහත මිල ගණන් යටතේ එම සේවාවන් ඉටු කිරිමට අපහසු වී ඇත. එබැවින් ඉන්ධන මිල ඉහළ යාමට සාපේක්ෂව මෝටර්ග්‍රේඩරය හා බැකෝලෝඩරය කුලියට දීමේ ගාස්තුව ඉහල දැමීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ඒ අනුව මෝටර්ග්‍රේඩරය,බැකෝලෝඩරය හා ගල් රෝල කුලියට දීමේ දී මීටර් පැයක් සඳහා නව කුලිය ලෙස,

| රථ වාහන | මීටර් පැයක් සඳහා කුලිය රු. | මීටර් පැයක් සඳහා නව කුලිය රු. |
|---|---|---|
| මෝටර්ග්‍රේඩරය | 4,000.00 | 5,500.00 |
| බැකෝලෝඩරය | 3,000.00 | 4,500.00 |
| ගල් රෝල | 4,000.00 | 4,500.00 |

අය කිරීම සුදුසු බවටසාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මෝටර්ග්‍රේඩරය,බැකෝලෝඩරය හා ගල් රෝල කුලියට දීමේ දී මීටර් පැයක් සඳහා නව කුලිය ලෙස රු. 5,500.00, රු.4,500.00 හා රු.4,500.00 යන මුදල අය කිරිම සුදුසු බවට තීරණය විය.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.
එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.04. කොටගම බලාගාරය ආශ්‍රිත ග්‍රාමීය ජල විදුලි ව්‍යාපෘතිය සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයට අයත් කොටගම බලාගාරය ආශ්‍රිත ග්‍රාමීය ජල විදුලි ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරිම සඳහා ඌව පළාත් සභා ප්‍රතිපාදන (විදුලි බල අමාත්‍යාංශ) මත ආරම්භ කර ඇත. එය දැනට ග්‍රාමීය ප්‍රජා සංවිධානයක් විසින් නඩත්තු කරමින් පවති. මෙම බලාගාරය මෙම ප්‍රදේශයට මහඟු සම්පතක් වන අතර ක්‍රමානුකූලව ජල විදුලි උත්පාදනය සිදු

කරන්නේ නම් 1000 KW ( 1MW) ක විදුලි ධාරිතාවක් උත්පාදනය කිරිමට හැකියාව ඇති බව ප්‍රජා සංවිධාන වාර්තා මඟින් තහවුරු වේ.

මෙම ව්‍යාපෘතියට අදාලව භාවිත කරන ලද ඩයිනමෝව ක්‍රියා විරහිත වීම හේතුවෙන් ව්‍යාපෘතියේ කටයුතු අත්හැර දමා ඇත. පසු ගිය දිනක ඌව පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් තුමාද මෙම ස්ථානය පිළිබඳ ස්ථානිය පරික්ෂාවක් සිදු කරන ලද අතර එතුමාගේ අදහස වූයේ ද මෙම ව්‍යාපෘතිය ප්‍රාදේශිය සභාව වෙත පවරා ගෙන විදුලි උත්පාදනයට අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කර රජයේ විදුලි බල මණ්ඩලයට යොමු කර පොදු ජනතාව වෙත විදුලිය ලබා දිම සුදුසු බවත් එමඟින් ප්‍රාදේශිය සභාව වෙත ද අමතර ආදායමක් උපයා ගත හැකි බැවින් මෙම ව්‍යාපෘතිය සම්බන්ධව ඉදිරි කටයුතු සිදු කිරිම සුදුසු බවය ඒ අනුව අදාල යෝජනාව ඉටුකිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රි කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>05.01.05. දිවා සුරැකුම් මධ්‍යස්ථානය , ආයුර්වේදය සහ මහජන උපයෝගිතා සේවා මධ්‍යස්ථානය ඉදි කිරිම සම්බන්ධවයි.</u>

බිබිල ප්‍රාදේශිය සභාව මඟින් ඉදිකිරිමට යෝජිත ඉහත ගොඩනැඟිල්ල ඉදි කිරිම වෙනුවෙන් ප්‍රසම්පාදන කැඳවා ව්‍යුහාත්මක විස්තර සහිත සැලසුම් හා ඇස්තමේන්තු සකස් කර පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇත.

01. ඉහත සඳහන් ගොඩනැඟිල්ල බිබිල ප්‍රාදේශිය සභා පෙර පාසල පිහිටි ඉඩමේ ඉදි කිරිමට යෝජිතය.

02. ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල රු.**64,441,164.30** කි. (සාරාංශ වාර්තාවක් අමුණා ඇත)

03. මෙම ගොඩනැගිල්ල මහල් දෙකකින් සමන්විත වන අතර,

| | | |
|---|---|---|
| බිම් මහල | - | පෙර පාසල සහ දිවා සුරැකුම් මධ්‍යස්ථානයකට සුදුසු පරිදි ඉදිකිරිම. |
| පළමු මහල | - | කඩ සාප්පු සහිත මහජන සේවා සපයන මධ්‍යස්ථානවලට සුදුසු පරිදි ඉදිකිරිම |
| දෙවන මහල | - | දේශන ශාලා පහසුකම් සහිතව ඉදිකිරිම. |

මෙම ගොඩනැඟිල්ලෙහි බිම් මහල සඳහා 2022 වසරට මිල සංශෝධිත ඇස්තමේන්තුගත මුදල රු. **16,980,511.20** වන අතර එම මුදල සභා අරමුදලින් යොදවා ඉදිකිරිමට යෝජනා කරන අතර අනෙකුත් මහල් සඳහා කඩ කාමර බදු දි බදුකරුවන්ගෙන් පෙර ගෙවුම් ලබා ගෙන ඉදි කිරිම සුදුසු බව යෝජනා කරමි.මෙහි එක් කඩකාමරයක් සඳහා පෙර ගෙවුම් (Key money) වටිනාකම රු. 3,000,000.00 වන අතර කඩ කාමර 5 ක් සඳහා රු. 15,000,000.00 ක මුදලක් සභාවට ආදායම් ලැබෙන අතර ඉහත ගොඩනැඟිල්ල ඉදි කිරිම සඳහා ඌව පළාත තුළ ප්‍රසම්පාදනකරුවන් කැඳවා සුදුසු කොන්ත්‍රාත් කරුවකු තෝරා ගැනිම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ඒ අනුව මෙම කඩකාමර අවුරුදු 30ක බදු ගිවිසුමක් මත රු. 3,000,000.00ක කී මනි මුදලක් අය කර ගෙන ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත කටයුතු කිරීමටත් එක් කඩකාමරයක් සඳහා මාසික කුලිය ලෙස රු.5,000.00ක් අය කිරීමටත් බිබිල බල ප්‍රදේශය තුල පදිංචිකරුවන්ගෙන් පමණක් ප්‍රසම්පාදන අයදුම්පත් කැදවීම සුදුසු බවත් සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මෙම කඩකාමර අවුරුදු 30ක බදු ගිවිසුමක් මත රු. 3,000,000.00ක කී මනි මුදලක් අය කර ගෙන ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත කටයුතු කිරීමටත් එක් කඩකාමරයක් සඳහා මාසික කුලිය ලෙස රු.5,000.00ක් අය කිරීමටත් බිබිල බල ප්‍රදේශය තුල පදිංචිකරුවන්ගෙන් පමණක් ප්‍රසම්පාදන අයදුම්පත් කැදවීම සුදුසු බවත් තීරණය විය.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.
එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.06.බිබිල ආදාහනාගාරයේ කටයුතු අධීක්ෂණය සඳහා තාවකාලික වැඩ පරිපාලකවරයෙකු පත් කිරිම සම්බන්ධවයි.

2021.12.28 දිනැති ලිපිය මඟින් පළාත් පාලන කොමසාරිස්තුමා විසින් බිබිල ප්‍රාදේශීය සභාවේ අධීක්ෂණය යටතේ දැනට ඉදිකිරීම් කටයුතු කරන බිබිල ආදාහනාගාරයේ වැඩ අධීක්ෂණය සඳහා අරවින්ද, ගලබැද්ද,මොණරාගල ලිපිනයේ පදිංචි කේ.එම්.රුවන් ප්‍රදීප් බංඩාර මහතා හට ගෙවීම් කිරීමටත් තාවකාලික වැඩ පරිපාලක ලෙස රාජකාරි ඉටු කර ගැනීම සඳහා සේවයේ යොදවා ගැනීමත් සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහි දී ව්‍යාපෘතිය අවසන් වූ පසු ඔහුගේ සේවය යොදවා ගැනීම අවසන් වන බවත් මොහු සභාවේ සේවකයකු නොවන බවත් තව දුරටත් විස්තර කරන ලදී. එබැවින් තාවකාලිකව මොහු යොදවා ගැනීම සුදුසු බවට සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහි දී ව්‍යාපෘතිය අවසන් වූ පසු ඔහුගේ සේවය යොදවා ගැනීම අවසන් වන බවත් මොහු සභාවේ සේවකයකු නොවන බවත් තව දුරටත් විස්තර කරන ලදී. එබැවින් තාවකාලිකව මොහු යොදවා ගැනීම සුදුසු බවට තීරණය විය.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.
එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>05.01.07.ජල බිල්පත් සඳහා ස්ථාවර ගාස්තුව සංශෝධනය කිරීම සම්බන්ධවයි.</u>

බිබිල රතුපස්කැටිය ජල යෝජනා ක්‍රමයේ ස්ථාවර ගාස්තුව රු.100.00 සිට රු.200.00 දක්වා වැඩි කිරීම හේතුවෙන් කවුඩැල්ල ගම්වාසීන් පීඩාවට පත් වී ඇති අතර මාසික ජල බිල්පතේ ස්ථාවර ගාස්තුව පෙර තිබූ රු.100.00 දක්වා අඩු කරන ලෙස ඉල්ලමින් ලිපියක් ඉදිරිපත් කර ඇත.මේ පිළිබඳ සාකච්ඡා කර තීරණයක් ගැනීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.
අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මේ පිළිබඳ සාකච්ඡා කළ මන්ත්‍රී මණ්ඩලය එම ව්‍යාපෘතියේ වත්මන් තත්ත්වය පිළිබඳ කරුණු පැහැදිලි කර ගැනීම සඳහා ව්‍යාපෘති භාරව කටයුතු කරන නිලධාරිතුමා කැඳවා කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව මෙම ව්‍යාපෘතිය නඩත්තු කටයුතු සඳහා හා විදුලි බිල්පත් පියවීමට දැනට ලැබෙන මුදල ප්‍රමාණවත් නොවන බවත් එම හේතුවෙන් මුදල සංශෝධනය නොකරිම හා ජනතාව දැනුවත් කිරිම සුදුසු බවට සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මේ පිළිබඳ සාකච්ඡා කළ මන්ත්‍රී මණ්ඩලය එම ව්‍යාපෘතියේ වත්මන් තත්ත්වය පිළිබඳ කරුණු පැහැදිලි කර ගැනීම සඳහා ව්‍යාපෘති භාරව කටයුතු කරන නිලධාරිතුමා කැඳවා කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව මෙම ව්‍යාපෘතිය නඩත්තු කටයුතු සඳහා හා විදුලි බිල්පත් පියවීමට දැනට ලැබෙන මුදල ප්‍රමාණවත් නොවන බවත් එම හේතුවෙන් මුදල සංශෝධනය නොකරිම හා ජනතාව දැනුවත් කිරිම සුදුසු බවට තීරණය විය.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.
එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.08.JCB යන්ත්‍රය සඳහා ඉදිරිපත් කර තිබූ මිල ගණන් සංශෝධනය කිරීම සම්බන්ධවයි.

DMG කොන්ත්‍රාත් ආයතනය මඟින් බිබිල ප්‍රාදේශීය සභාවට JCB යන්ත්‍රය ලබා දීමේ දී ඉන්ධන ලීටරයක මිල රු.100කට ආසන්නයේ පැවති අතර මේ වන විට අධික ලෙස ඉන්ධන මිල ඉහල යාම නිසා පැයකට ඉන්ධන සඳහා වැඩිපුර රු.500.00ක මුදලක් වැය වෙන බැවින් ඉදිරිපත් කර තිබූ මිල ගණන් සංශෝධනය කර 2022.03.11 දින සිට පැයකට රු.3,500.00ක මුදලක් ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇති අතර එම ඉල්ලීම සාධාරණ බැවින් එම මුදල ලබා දීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහි දී මෙම සභා තීරණයෙන් පසු නැවත මිල ගණන් කැඳවීම සුදුසු බවට සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

සභා තීරණයෙන් පසු නැවත මිල ගණන් කැඳවීම සුදුසු බවට තීරණය විය.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.
එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.09.බිබිල ප්‍රාදේශීය සභාව සතු මාර්ග ගැසට් කිරීම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාව සතු මාර්ග නිවැරදිව ගැසට් කර නොතිබීමත් මාර්ග සංවර්ධන කිරීමේ දී හා විවිධ අවස්ථාවලදී ගැටලු රාශියකට මුහුණ දීමට සිදු වන බැවින් වයඹ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ සහයෝගය ලබාගෙන GPS තාක්ෂණය යොදා මිනුම් කර ගැසට් මඟින් ප්‍රකාශයට පත් කිරීමටත් ඒ සඳහා බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රමයේ සේවකයන් යොදවා ගැනීමටත් අවශ්‍ය වන උපකරණ ලබා දීමටත් ආයතන සංග්‍රහය අනුව ගමන් වියදම් ලබා දීම සුදුසු බවත් මෙම කටයුත්ත කඩිනමින් අවසන් කිරීම සඳහා වෘත්තීය පුහුණු ආයතනවල හා කාර්මික විද්‍යාලවල පුහුණු ලබන්නන් යොදවා ගැනීම සුදුසු බවත් මෙම ගරු සභාවට යෝජනා කරමි.
අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.10.2022 වර්ෂය සඳහා බිබිල බල ප්‍රදේශය තුල ජලභීතිකා එන්නත්කරණ වැඩසටහන සම්බන්ධවයි.**

2022 වර්ෂයේ දී ජලභීතිකා රෝග මර්ධන වැඩසටහනේ අධ්‍යක්ෂකතුමා පැමිණ එන්නත්කරණ වැඩසටහන වෙනස් කරමින් කෙටි කාලයක් තුල කණ්ඩායමක් ලෙස වසම්වලට ගොස් එන්නත්කරණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරිමට සාකච්ඡා විය. ඒ අනුව බිබිල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය හා එක්ව බිබිල ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුල සිටින සුනඛයින් හා බළලුන් හට ජලභීතිකා එන්නත ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කළ බවත් සුනඛ කරපටි අලෙවියෙන් පසු අපේක්ෂිත ආදායම රු.150,000.00ක් වන අතර සුනඛ කරපටි හා ඉන්ධන වියදම් ලෙස මේ වන විටත් රු.167,852.00ක මුදලක් වැය වූ අතර එම මුදල සභා අරමුදලින් දැරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි. ආදායම් වියදම් සඳහා වූ පරිපූරක ඇස්තමේන්තුවේ සාරාංශය පහත දැක්වේ.

**ආදායම් හා වියදම් සාරාංශය**

| ආදායම | | | වියදම | | |
|---|---|---|---|---|---|
| අතිරික්ත ආදායම | | | අතිරික්ත ආදායම සඳහා වියදම | | |
| පුනරාවර්තන ආදායම | 167,850.00 | | පුනරාවර්තන වියදම | 167,850.00 | |
| | | 167,850.00 | | | 167,850.00 |
| | | 167,850.00 | | | 167,850.00 |

**පුනරාවර්තන ආදායම් හා වියදම්**

| අය ශීර්ෂ | අතිරික්ත ආදායම රු. | වැය සංකේත හා වැය ශීර්ෂ | ඉදිරි මාස සඳහා පරිපූරක ඇස්තමේන්තුව රු. |
|---|---|---|---|
| 163 සුනඛ කරපටි අලෙවියෙන් ලද ආදායම | 150,000.00 | 203-6 සුනඛ කරපටි සඳහා වියදම | 125,000.00 |
| 205-5 සෞඛ්‍ය සේවා හා සනීපාරක්ෂක සේවා (ඩෙංගු,ජලභීතිකා,මත්ද්‍රව්‍යථආහාර සාම්පල්) | 17,850.00 | 203-1 සුනඛ එන්නත්කරණ වැඩසටහන එන්නත් වියදම | 42,850.00 |
| **අතිරික්ත ආදායම** | **167,850.00** | **එකතුව** | **167,850.00** |

අදාළ යෝජනාව ගරු මන්ත්‍රිනී ඒ.එම්. නදීශා ජයමිණී ගුණසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහි දී අයාලේ යන සුනඛයින් හා බළලුන් හට සෙනසුරාදා හා ඉරිදා වන්ධ්‍යාකරණ කටයුතු කරන බවත් මෙය ඇතැම් ප්‍රදේශවල ක්‍රියාත්මක වී නොමැති බවත් ඒ පිළිබඳව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතුමාව දැනුවත් කිරිමටත් වියදම සහා අරමුදලින් ගෙවීමටත් පරිපූරක ඇස්තමේන්තුව අනුමත කිරීමටත් සුදුසු බවටත් වැඩිදුරටත් සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහි දී අයාලේ යන සුනඛයින් හා බළලුන් හට සෙනසුරාදා හා ඉරිදා වන්ධ්‍යාකරණ කටයුතු කරන බවත් මෙය ඇතැම් ප්‍රදේශවල ක්‍රියාත්මක වී නොමැති බවත් ඒ පිළිබඳව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතුමාව දැනුවත් කිරිමටත් වියදම සහා අරමුදලින් ගෙවීමටත් පරිපූරක ඇස්තමේන්තුව අනුමත කිරීමටත් සුදුසු බවට තීරණය විය.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.
එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>05.01.11. අභියාචනාධිකරණ නඩු සඳහා පෙනී සිටින නීතීඥ මහතාට අදාළ නඩු ගාස්තු ගෙවීම සම්බන්ධවයි.</u>

මේ වන විට අභියාචනාධිකරණයේ විභාග වෙමින් පවතින පහත නඩු සඳහා බිබිල ප්‍රාදේශීය සභාව වෙනුවෙන් නීතීඥ හරීන්ද්‍ර රාජපක්ෂ මහතා යොදවා ගැනීමටත් මේ මහතා විසින් රු.500,000.00 බැගින් ඉල්ලීම් කර ඇත. එමෙන්ම මෙම නඩු ගාස්තු නීතීඥ මහතා ඉල්ලුම් කරන පරිදි කොටස් වශයෙන් ගෙවිය යුතු වන අතර මෙම නඩු ගාස්තු ගෙවීමට අවශ්‍ය කටයුතු සලසා දිම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

| **අභියාචනාධිකරණ නඩු අංකය** | **නම** | **අනවසර ඉදිකිරීම** |
|---|---|---|
| 79/2019 | ධර්මසිරි ජයසිංහ | උතුරට බිබිල බස් නැවතුම්පොල භූමියද ,නැගෙ: අනුමත කඩ කාමර ඉහළ මහලට යන පඩි පෙළද,දකුණට එම්.ඒ.ආරියදාස මයාගේ අනවසර කඩ කාමරයද,බස්නා:බිබිල බදුල්ල මාර්ගයද යන මායිම් තුළ කඩ කාමර 3ක් ඉදිකිරීම. |
| 80/2019 | ආර්.ඩී.ඇන්ටන් ප්‍රනාන්දු | බිබිල බස් නැවතුම් වම්පස තානායමේ ඉඩමේ වැටට යාබදව කඩ කාමරයක් ඉදිකිරීම. |
| 81/2019 | කේ.එච්.බුද්ධදාස | බිබිල බස් නැවතුම් වම්පස තානායමේ ඉඩමේ වැටට යාබදව කඩ කාමරයක් ඉදිකිරීම. |
| 82/2019 | එච්.එම්.කරුණාසුන්දර | බිබිල බස් නැවතුම් වම්පස තානායමේ |

| | | |
|---|---|---|
| | | ඉඩමේ වැටට යාබදව කඩ කාමරයක් ඉදිකිරීම. |
| 83/2019 | අලවත්තගේ වොඩිසන් | බිබිල බස් නැවතුම්පල වම්පස තානායමේ ඉඩමේ වැටට යාබදව කඩ කාමරයක් ඉදිකිරීම. |
| 84/2019 | ටී.එම්.වීරවර්ධන | උතු: බස්නැවතුම්පල භූමියද,නැගෙ:අනුමත කඩ කාමරයද,දකු: පඩිපෙල සවිවන බිත්තියද, බස්නාහි: අනුමත කඩ කාමර වල ඉහල මහලට යන පඩිපෙලද යන මායිම් තුළ කඩකාමරයක් ඉදි කිරීම. |
| 85/2019 | එම්.ඒ.ආරියදාස | බිබිල බස් නැවතුම්පල වම්පස තානායමේ ඉඩමේ වැටට යාබදව කඩ කාමරයක් ඉදිකිරීම. |
| 86/2019 | එම්.ඒ.ආරියදාස | උතු:ධර්මසිරි ජයසිංහ මයාගේ කඩ කාමර 3,නැගෙ:අනුමත කඩ කාමරයෙහි පඩි පෙළද, දකු:අබ්දුල් කුද්දූස් එහියා මයගේ අනවසර කුකුල්මස් කඩයද , බස්නා: බිබිල බදුල්ල මාර්ගයද යන සීමාව තුළ කඩ කාමරයක් ඉදි කිරීම. |
| 87/2019 | පී.ඩී.කපිල ගුණසේකර | බිබිල බස් නැවතුම්පල වම්පස තානායමේ ඉඩමේ වැටට යාබදව කඩ කාමරයක් ඉදිකිරීම. |
| 168/2016 | බුද්ධික එදිරවීර | බිබිල මඩකලපුව පාරේ දකුණු පස තැ.කා. අසලින් ඇති බිබිල කිවුලපිටලන්ද මාර්ගයේ සිට අඩි 34.9ක් දුරින් දකුණුපස කඩකාමරය ඉදි කිරීම. |
| 142/2017 | ඩී.එම්.ධර්මදාස | බිබිල මඩකලපුව පාරේ දකුණු පස තැ.කා. අසලින් ඇති බිබිල කිවුලපිටලන්ද මාර්ගයේ සිට අඩි 43ක් දුරින් දකුණුපස කඩකාමරය ඉදි කිරීම. |

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහි දී පළාත් පාලන කොමසාරිස් කාර්යාලය හරහා පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් නීතිඥ සහය ලබා ගැනීමට හැකි නම් එය සුදුසු බවත් ඉදිරියේ දී නඩු කටයුතු සඳහා සහන ගාස්තුවක් ලබා දෙන්නේ නම් එය සුදුසු බවත් දැනට නීතිඥ මහතා ඉල්ලුම් කරන පරිදි කොටස් වශයෙන් ගෙවීම සුදුසු බවටත් සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.
පළාත් පාලන කොමසාරිස් කාර්යාලය හරහා පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් නීතිඥ සහය ලබා ගැනීමට හැකි නම් එය සුදුසු බවත් ඉදිරියේ දී නඩු කටයුතු සඳහා සහන ගාස්තුවක් ලබා දෙන්නේ නම් එය සුදුසු බවත් දැනට නීතිඥ මහතා ඉල්ලුම් කරන පරිදි කොටස් වශයෙන් ගෙවීම සුදුසු බවටත් තීරණය විය.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.
එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>05.01.12. ආපදා කළමනාකරණ කමිටුව පත්කර ගැනීමට සහා අනුමැතිය ලබා ගැනීම සම්බන්ධවයි.</u>

බිබිල ප්‍රාදේශීය සභාව තුළ මේ වන විට ආපදා කළමනාකණ කමිටුවක් පිහිටුවා නොමැති බැවින් එම කමිටුව පත් කිරීම සුදුසු බවත් ඒ සඳහා අවශ්‍ය උපකරණ මිල දී ගැනීම සුදුසු බවත් මෙම ගරු සභාවට යෝජනා කරමි.
කමිටුවේ පිරිස් සංයුතිය හා අවශ්‍ය උපකරණ පහත දැක්වේ.

01. ගරු සභාපතිතුමා
02. බිබිල කොට්ඨාශ ගරු මන්ත්‍රීතුමා
03. සභා ලේකම්
04. කාර්මික නිලධාරි
05. ප්‍රධාන කළමනාකරණ සහකාර
06. විෂයභාර නිලධාරි

**කමිටු සේවක පිරිස්**

01. කැබ් රථ රියදුරු - පී.එම්.පත්මසිරි බණ්ඩාර
02. ට්‍රැක්ටර් රථ රියදුරු - ඩී.එම්.සිරිල් දිසානායක
03. ඩී.එම්.ගුණදාස
04. එච්.බී.කවිතිලක
05. පී.සාලින්ද ජයලත්
06. ඒ.එම්.සරත් පියසෝම
07. ඩී.එම්.ප්‍රවීන් රංගන

**කමිටුව සඳහා අවශ්‍ය උපකරණ**

01. චේන්සෝ මැෂින් 01
02. පොරෝ 01
03. මන්නා පිහි 01
04. ලන්ඩා 01
05. ලොකු නයිලෝන් කඹ 01
06. ට්‍රැක්ටර් රථ 01
07. ජල බවුසරු 01
08. JCB යන්ත්‍රය

(මෙම සේවක පිරිස හා උපකරණ ඕනෑම ආපදා අවස්ථාවක ක්‍රියාත්මක වීමට සූදානම් කර තැබිය යුතුය) මෙහි සඳහන් චේන්සෝ මැෂින් 01, පොරෝ 01, මන්නා පිහි 01, ලන්ඩා 01 හා ලොකු නයිලෝන් කඹ 01 මිලදී ගැනීමටත් තීරණය විය.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.13. ඇස්තමේන්තු අනුමත කිරීම.

සභා බල ප්‍රදේශයේ මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා සකස් කර ඇති පහත ඇස්තමේන්තු අනුමත කිරීම සුදුසු බවත් මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | ඇස්තමේනතු මුදල (රු) |
|---|---|---|
| 01 | කොටගම ගල්කඩ සුසාන භූමිය මාර්යේ බෝක්කුවක් ඉදිකිරීම. | 450,000.00 |
| 02 | දැවනේලන්ද මාර්ගයේ බෝක්කුවක් ඉදිකිරීම. | 385,000.00 |
| 03 | දැවනේලන්ද 2 වන පටුමග මාර්ගයේ බෝක්කුවක් ඉදිකිරීම. | 400,000.00 |
| 04 | කුරුවාඹ කොලොන්ගස්ලන්ද 4 වන පටුමග මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 500,000.00 |
| 05 | කුරුවාඹ සල්ගස් හන්දිය අගලහ කුඹුර මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 563,958.96 |
| 06 | අබෙලන්ද කපුලන්ද මාර්ගය කොන්ක්‍රීට් කිරීම. | 1,069,876.15 |
| 07 | හාමාපොල නුගගහදෙනිය මාර්ගය කොන්ක්‍රීට් කිරීම. | 1,089,963.83 |
| 08 | පිටකුඹුර ගොවිසෙවන අසල මාර්ගය කොන්ක්‍රීට් කිරීම. | 548,100.15 |
| 09 | නාගල පිං බෝධිය ඉදිරිපිට මාර්ගය කොන්ක්‍රීට් කිරීම. | 1,185,860.78 |
| 10 | හැමගස්මුල්ල මාර්ගය කොන්ක්‍රීට් කිරීම. | 1,055,482.80 |
| 11 | ඉළුකාපතන උක්මෝල මාර්ගය කොන්ක්‍රීට් කිරීම. | 540,456.54 |
| 12 | රදලියද්ද තලපලාදෙන මාර්ගය කොන්ක්‍රීට් කිරීම. | 567,787.94 |
| 13 | උස්සාගල කොලොන්ගොල්ල මාර්ගය කොන්ක්‍රීට් කිරීම. | 597,624.86 |
| 14 | රදලියද්ද පොරකටුව (මරණාධාර සමිතිය ඉදිරිපිට මාර්ගය කොන්ක්‍රීට් කිරීම i අධියර) | 1,745,691.42 |
| 15 | රදලියද්ද පොරකටුව මාර්ගය කොන්ක්‍රීට් කිරීම ii අධියර | 1,625,324.44 |
| 16 | කරගහවෙල මහවෙල දෙහිගහ උහන මාර්ගය කොන්ක්‍රීට් කිරීම. | 521,909.83 |
| 17 | කරගහවෙල පට්ටියන්ගොඩ මාර්ගය කොන්ක්‍රීට් කිරීම. | 532,410.16 |
| 18 | බිබිල ගොවිපල ඉදිරිපිට මාර්ගය කොන්ක්‍රීට් කිරීම. | 531,360.68 |
| 19 | බිබිල ගල්ගේලන්ද මාර්ගය දෙවන පටුමග කොන්ක්‍රීට් කිරීම. | 523,892.12 |
| 20 | බිබිල දම්පතිගම දෙවන පටුමග කොන්ක්‍රීට් කිරීම. | 1,060,373.41 |
| 21 | වාහන නැවතුම්පොල ගොඩනැගිල්ල ගලවා නිල නිවාස පිහිටි ඉඩමේ සවි කිරීම | 1,050,000.00 |

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකගතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.14. ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය යටතේ 4 හා 5 වන වාරිකවලට අදාළ ව්‍යාපෘති යෝජනා අනුමැතියට ඉදිරිපත් කිරීම.

ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය යටතේ 4 හා 5 වන වාරිකවලට අදාළව රු. මිලියන 21.37ක් බිබිල ප්‍රාදේශීය සභාවට ලැබී ඇති අතර එම මුදල බිබිල සතිපොලෙහි නිම් වී නොමැති වැඩ සඳහා (බිබිල සතිපොලෙහි ගොඩනැගිල්ලේ කොන්ක්‍රීට් වහලය හා අවට කඩකාමර තැනීම) මෙම මුදල යෙදවීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.15. සභා ලේකම් තනතුරෙහි රාජකාරි ඉටුකිරීම සම්බන්ධවයි.

සභා ලේකම් තනතුරේ රාජකාරි ඉටු කිරීම සඳහා දැනට රාජකාරි ඉටුකරනු ලබන ඒ.බී.ප්‍රසංග නලීන් කුමාර මහතාම ඉදිරියටත් යොදවා ගැනීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකගතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.16. තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින් පත් කිරීම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාවට මිළදී ගන්නා ලද ඇතැම් භාණ්ඩ සඳහා තාක්ෂණික දැනුමක් අවශ්‍ය බැවින් තාක්ෂණික ඇගයීම් කමිටුව පහත නිලධාරින් පත් කිරිම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

පරිගණක දැනුම, මෘදුකාංග හා වෙනත් කටයුතු සඳහා,

චමින්ද හේමපාල මයා - වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, බිබිල

එච්.එම්.වී.පී.අභය ගුණවර්ධන මයා - පරිගණක ගුරු, මහා මාතා විද්‍යා විද්‍යාලය,බිබිල

එම්.කේ.ක්‍රිෂාන්ත විජේවර්ධන මයා - IT අංශය භාරකරු,තැපැල්ගල,බිබිල

වෙනත් තාක්ෂණික උපකරණ සඳහා,

ටී.ආර්.එම්.සුලෝචනා සෙනෙවිරත්න මිය - කාර්මික නිලධාරී,ප්‍රාදේශීය සභාව,බිබිල

ඒ.එම්.එන්.එස්.අධිකාරි මයා - කාර්මික නිලධාරී,ප්‍රාදේශීය සභාව,බිබිල

ඩබ්.ඒ.එල්.කුමාර මයා - සංවර්ධන නිලධාරි

එච්.එම්. දිනූෂිකා සඳමාලී හේරත් මිය - සංවර්ධන නිලධාරි

ඩී.එම්.මහේෂ මධුෂාන් මයා - වැඩ පරිපාලක, ප්‍රාදේශීය සභාව,බිබිල

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.
යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.
එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.02. ගරු මන්ත්‍රනී ඩී.එම්. කරුණාවතී මැතිතුමිය

## 05.02.01. කාන්තා දිනය සැමරීමේ වැඩසටහන් පිළිබඳ යෝජනා ඉදිරිපත් කිරිම.

ජාත්‍යන්තර කාන්තා දිනය නිමිතිකොටගෙන වැඩ සටහනක් පැවැත්වීම, බිම් මට්ටමේ කාන්තාවන් දැනුවත් කිරිම හා සිංහල දෙමළ අලුත් අවුරුද්දට සමගාමීව කාන්තා වෙළඳ ප්‍රදර්ශනයක් සහ අලෙවිය සම්බන්ධව සාකච්ඡා කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහි දී ඩී.එම්. කරුණාවතී මැතිතුමිය විසින් මෙම වැඩසටහන් පිළිබඳ කරුණු පැහැදිලි කළ අතර සිංහල දෙමළ අලුත් අවුරුද්දට සමගාමීව කාන්තා වෙළඳ ප්‍රදර්ශනයක් සහ අලෙවිය සම්බන්ධව යෝජිත දිවා සුරකුම් මධ්‍යස්ථානය හා ආයුර්වේදය අසල මාර්ගයේ බිම් කොටස ඒ සඳහා යොදා ගැනීම සුදුසු බවට සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.
ඩී.එම්. කරුණාවතී මැතිතුමිය විසින් මෙම වැඩසටහන් පිළිබඳ කරුණු පැහැදිලි කළ අතර සිංහල දෙමළ අලුත් අවුරුද්දට සමගාමීව කාන්තා වෙළඳ ප්‍රදර්ශනයක් සහ අලෙවිය සම්බන්ධව යෝජිත දිවා සුරකුම් මධ්‍යස්ථානය හා ආයුර්වේදය අසල මාර්ගයේ බිම් කොටස ඒ සඳහා යොදා ගැනීම සුදුසු බවට තීරණය විය.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.
එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.03. ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා

## 05.03.01. සංවර්ධන යෝජනා.

දොඩම්ගොල්ල, දෙහිඅත්තාවෙල ග්‍රාම නිලධාරි වසම් දෙකට අයත් වට පොකුණ කිරලාන මාර්ගය විජයකෝන් මහතාගේ නිවස අසල කොටස නිතර උල්දිය වැටිම නිසා මීටර් 30ක් පමණ කොන්ක්‍රීට් අතුරා මාර්ගය සංවර්ධනය කිරිම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.
යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.
එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 06. කාරක සභා වල වාර්තා ඉදිරිපත් කිරිම.

## 06.01. 2022 වර්ෂයේ සිංහල දෙමළ අළුත් අවුරුද්ද නිමිතිකර ගෙන වොලිබෝල් ක්‍රීඩා තරඟය සම්බන්ධවයි.

නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව ඉදිරිපත් කිරිම ගරු සභාපති ජී.ජී.ආර්. සිල්වා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලදි.

එම වාර්තාව මඟින් ඔවුන් යෝජනා කර තිබූයේ 2021 වර්ෂයේ සිංහල දෙමළ අළුත් අවුරුද්ද නිමිතිකර ගෙන අත්පන්දු ක්‍රීඩා තරඟයක් පැවැත්විමටය. නමුත් කොරෝනා වසංගත තත්ත්වය නිසා පැවැත්වීමට නොහැකි වූ බැවින් එය මෙම වසරේ පැවැත්වීම සුදුසු බවයි.

එම යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසුරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මේ සම්බන්ධයෙන් වැඩිදුර සාකච්ජා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහිදි 2022.04.17 දින මූලික තරඟව ටය බිබිල මහජන දී ක්‍රීඩාංගනයේදී පෙ.ව.9.00 සිට පැවැත්වීමටත් අවසාන මහා තරඟය හා ත්‍යාග ප්‍රධානෝත්සවය ගරු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමන් ඇතුළු සම්භාවනීය අමුත්තන්ගේ සහභාගිත්වයෙන් එදිනම ප.ව.7.00ට බිබිල යසෝධරා බාලිකා විද්‍යාලය අසල නව දිවා රාත්‍රී වොලිබෝල් ක්‍රීඩාංගනයේදී පැවැත්වීමටත් 1 ,2, 3 ස්ථාන ලබා ගන්නා කණ්ඩායම් වලට පිළිවෙලින් 50,000.00 රු. 30,000.00 රු. 20,000.00 ත්‍යාග ලබා දීමටත් ඒ සඳහා අනුග්‍රාහක භවතුන් කිහිප දෙනකු සම්බන්ධ කර ගැනිමටත් සහභාගි වන සෑම කණ්ඩායම් 40ටම දැලක් සහ අත් පන්දුවක් සභාව මඟින් පිරි නැමීමටත් එම කටයුතු හා සංග්‍රහ කටයුතු සඳහා වැය වන රු. 400,000.00 ට අදාළ ඇස්තමේන්තුවට ගරු ආණ්ඩුකාර තුමාගේ අනුමැතිය ලබා ගැනිම සුදුසු බවටත් සාකච්ජා විය.

සාකච්ඡාවෙන් අනතුරුව කාරක සභාව මහ සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී බි. විල්මට් සිල්වා මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහිදි 2022.04.17 දින මූලික තරඟව ටය බිබිල මහජන දී ක්‍රීඩාංගනයේදී පෙ.ව.9.00 සිට පැවැත්වීමටත් අවසාන මහා තරඟය හා ත්‍යාග ප්‍රධානෝත්සවය ගරු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමන් ඇතුළු සම්භාවනීය අමුත්තන්ගේ සහභාගිත්වයෙන් මෙදිනම ප.ව.7.00ට බිබිල යසෝධරා බාලිකා විද්‍යාලය අසල නව දිවා රාත්‍රී වොලිබෝල් ක්‍රීඩාංගනයේදී පැවැත්වීමටත් 1 ,2, 3 ස්ථාන ලබා ගන්නා කණ්ඩායම් වලට පිළිවෙලින් 50,000.00 රු. 30,000.00 රු. 20,000.00 ත්‍යාග ලබා දීමටත් ඒ සඳහා අනුග්‍රාහක භවතුන් කිහිප දෙනකු සම්බන්ධ කර ගැනිමටත් සහභාගි වන සෑම කණ්ඩායම් 40ටම දැලක් සහ අත් පන්දුවක් සභාව මඟින් පිරි නැමීමටත් එම කටයුතු හා සංග්‍රහ කටයුතු සඳහා වැය වන රු. 400,000.00 ට අදාළ ඇස්තමේන්තුවට ගරු ආණ්ඩුකාර තුමාගේ අනුමැතිය ලබා ගැනිම සුදුසු බවට තීරණය විය.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.
එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 06.02. 2022 ජනවාරි මුදල් හා ප්‍රතිපත්ති කමිටුව සම්බන්ධවයි.

මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව ඉදිරිපත් කිරිම කමිටුවේ සභාපති ගරු සභාපති ජී.ජී.ආර්. සිල්වා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලදි.

එම වාර්තාව මඟින් ඔවුන් යෝජනා කර තිබුනේ 2022 ජනවාරි මසයේදී PF 7391 අංක දරණ කැබ් රථයට අළුතින් ටයර් 04 ක් මිලදී ගැනිමට රු.175,000.00 ක මුදලක් G.D.D.සරත් වෙත ගෙවීමට නිර්දේශ කරන ලද අතර 2021 පොදු අරමුදල් යටතේ කරගහවෙල හැමගස්මුල්ල මාර්ගය කොන්ක්‍රීට් කිරිම ව්‍යාපෘතියේ වැඩ අවසන් බිල්පත් පියවමට රු.342,144.41 මුදලක් එක්සත් ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ගෙවීමට නිර්දේශ කිරීම, 2021 පොදු අරමුදල් යටතේ තැන්න කෘෂි මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘතියේ වැඩ අවසන් බිල් පත් පියවීමට රු.352,001.00 මුදලක් එකමුතු ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ගෙවීමට නිර්දේශ කිරිම. 2022 පෙබරවාරි මාසයේ දී පලාත් මට්ටමෙන් කාබනික පොහොර නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීමේ වැඩ සටහන යටතේ බිබිල පුවක් පැලේ කසල කළමනාකරණ මධ්‍යස්ථානය ඉදි කිරිම සඳහා 3 වන කොටස් මුදල වෙනුවෙන් රු.500,000.00 මුදලක් L.D.කන්ස්ට්‍රක්ෂන් වෙත ගෙවීමට නිර්දේශ කිරීම, බිබිල ප්‍රාදේශීය සභා නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාව සඳහා ලබා ගත් ඖෂධ වෙනුවෙන් බිල්පත් පියවීම වෙනුවෙන් රු.199,610.00 මුදලක් ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව වෙත ගෙවීමට නිර්දේශ කිරීම, බිබිල ප්‍රාදේශීය සභාවට අයත් 252-6355 කැබ් රථයට ඉදිරිපස හා පිටුපස සඳහා 235/70116 සියැට් ටයර් 04 ක් මිලදී ගැනීම වෙනුවෙන් රු.118,000.00 මුදලක් ඌව ටයර් සර්විස් (pvt) Ltd වෙත ගෙවීමට නිර්දේශ කිරීම සුදුසු බවයි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ජ්. උබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් කාරක සභා වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

## 07.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ එකතුකල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරිම හා සලකා බැලිම.

2022 පෙබරවාරි මාසයට අදාල ලැබිම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ (ප්‍රා.ස. 16 හා ප්‍රා.ස. 14) සහ හිඟ ආදායම් පිළිබඳ විස්තර (ප්‍රා.ස. 07)සභාවේ දැනගැනීම හා අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදි.

**ආදායම්**

| | |
|---|---|
| පුනරාවර්තන ආදායම් | **- රු. 7,893,701.04** |
| මූලධන ලැබීම් | **- රු.** 2,543,335.38 |
| **ප්‍රාග්ධන ලැබීම්** | **-** රු. - |
| වෙනත් ලැබිම් | - රු. 1,542,357.78 |
| මුළු ලැබීම් | **- රු 11,979,394.20** |

**වියදම්**

| | |
|---|---|
| පුනරාවර්තන වියදම් | - රු. 6,361,463.65 |
| ප්‍රාග්ධන වියදම් | - රු. 610,000.00 |
| ණය ආපසු ගෙවීම් | - රු. - |

| | |
|---|---|
| වෙනත් වියදම් | - රු. 5,416,492.49 |
| ආයෝජන | - රු. - |
| මුළු වියදම් | - රු **12,387,956.14** |

**2022.02.28 දිනට තවදුරටත් හිඟ ආදායම් විස්තරය**

| | |
|---|---|
| වරිපනම් බදු | - රු. 7,678,395.71 |
| අක්කර බදු | - රු. 5,415.68 |
| ජල ගාස්තු | - රු. 609,168.25 |
| ජල රතුපස්කැටිය ජල යෝජනා ක්‍රමය | - රු. 239,798.00 |
| කුලී මුදල් | - රු. 2,828,876.71 |
| ටෙන්ඩර් මඟින් කුලියටදීම් | - රු. 5,207,856.51 |
| එකතුව | - රු 16,569,510.86 |

ඉදිරිපත් කර ඇති ඉහත ආදායම් හා වියදම් වාර්තා ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අනතුරුව මෙම ආදායම් වියදම් හා හිඟ වාර්තා සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාවය විමසන ලදි.
ගරු සභාවේ මන්ත්‍රී මණ්ඩලයේ සියළු දෙනාද ඊට එකඟතාවය පලකළෙන් ආදායම් වියදම් හා හිඟ ආදායම් වාර්තා ඒකමතිකව සභා සම්මත විය.

## 08.වෙනත් කරුණු

## 08.01. මන්ත්‍රීවරුන් නිවාඩු බව දැන්වීම.

බී.එම්.ජයලත් බණ්ඩාර මැතිතුමා හා ආර්.බී. අත්තනායක මැතිතුමා වෛද්‍ය හේතුන් මත මෙදින මාසික සභා රැස්වීම සඳහා නොපැමිණෙන බව ලිඛිතව හා ටෙලිමේල් එකක් මගින් දන්වා ඇති අතර නිවාඩු අනුමත කිරීම සුදුසු බව යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.
යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.
එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා අදහස් දැක්වීම.**

ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා අදහස් දක්වමින් බිබිල ප්‍රදේශයේ ඉන්ධන බෙදාහැරීම ක්‍රමවත්භාවයක් නොමැති බවත් නැගෙනහිර පළාතේ මෙවැනි ඉන්ධන පෝලිමක් නොමැති බවත් බැරල් හා බූලිවලට ඉන්ධන නොදෙන බවත් අද ඉන්ධන වෙළඳසැල් කළුකඩ බවට පත් වී ඇති බවත් මේ පිළිබඳ ප්‍රධාන පරිපාලක නිලධාරිතුමිය දැනුවත් කර නිසි ක්‍රමවේදයක් යොදා ගන්නේ නම් සුදුසු බව පෙන්වා දෙමින් සිය අදහස් දැක්වීම නිමා කරන ලදි.

**ගරු මන්ත්‍රී එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා අදහස් දැක්වීම.**

ගරු මන්ත්‍රී එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා අදහස් දක්වමින් සන්දේශ සහ ලිපි අවස්ථාවේ දී ගමට පිවිසෙන මාර්ගයේ බෝක්කුව හා ගමට පිවිසෙන මාර්ගයේ අවහිරතාවය පිළිබඳ ඉදිරිපත් කලත් ඒ පිළිබඳ තවමත් පියවරක් නොගෙන ඇති බවත් විපක්ෂයේ යෝජනා පිළිබඳවද අවධානය යොමු කරන ලෙසත් ඉන්ධන ගැටළුව පිළිබඳව ද තවදුරටත් කරුණු

පැහැදිලි කළ අතර කේ.එම්. කපිල විජේසූරිය මන්ත්‍රීතුමාගේ නායකතුමා කැබිනට් මණ්ඩලයෙන් ඉවත් වී ඇති නිසා මෙම සභාව තුළ එතුමාගේ මතය බලාපොරොත්තු වන බවත් පවසමින් සිය අදහස් දැක්වීම නිමා කරන ලදි.

**<u>ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා අදහස් දැක්විම.</u>**

ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමාගේ ප්‍රශ්නයට අදහස් දක්වමින් මහින්ද සුළඟ ආරම්භ කර නැවත මහින්ද මහතා ජනපති කිරීමට උත්සහ කලත් එසේ කළ නොහැකි විය.බැසිල් මහතා පිටරට සිට පැමිණ නැවත පක්ෂයක් නිර්මාණය කළ අතර මහින්ද සුළඟට දායක වූ අයව ඉවත් කළ නමුත් හැටනව ලක්ෂයේ ජනමතයට පිටුපෑමට නොහැකි බවත් විපක්ෂයට සම්බන්ධ නොවන බවත් ජනතාව වෙනුවෙන් සිටින බවත් පවසමින් සිය අදහස් දැක්වීම නිමා කරන ලදි.

**<u>ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා අදහස් දැක්විම.</u>**

ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා අදහස් දක්වමින් අපේ රටේ ඇති වි ඇති අර්බුදකාරී තත්වය අවුරුදු 02ක් තුල ඇති වූවක් නොවන බවත් ජනතාව ආර්ථික හා සමාජීය වශයෙන් පහත් තත්ත්වයකට පත්ව ඇති බවත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, පක්ෂ භේද නොතකා රටේ සියළු දෙනාටම යහපතක් කිරීමට කටයුතු කරන බවත් සියළු දෙනාම එකතු වී ගම් මට්ටමින් හා ප්‍රාදේශීය මට්ටමින් සැලසුම් කර කටයුතු කරමු යන්න පවසමින් සිය අදහස් දැක්වීම නිමා කරන ලදි.

**<u>ගරු මන්ත්‍රී එච්.එම්. සරත් කුමාර මැතිතුමා අදහස් දැක්විම.</u>**

ගරු මන්ත්‍රී එච්.එම්. සරත් කුමාර මැතිතුමා අදහස් දක්වමින් තමුන්නාන්සෙලාගේ පාලකයෝ රට බංකොලොත් කර ඇති බවත් පසු ගිය සභාවාරයේ දී 05.01.12 සභා තීරණය යටතේ නව වෙළඳ සංකීර්ණයේ පඩිපෙළ යට ස්ථාන බදු දිම සම්බන්ධයෙන් හා ගිවිසුම් සම්බන්යෙන් යෝජනා ස්ථිර වී ඇති අතර එහි නම් සඳහන් අයට කුමන පදනමකින් එම කඩකාමර ලබා දී ඇද්ද යන්න දැන ගැනිමට කැමති බවත් ඉතිහාසයේ පුරාම සභාවට අයිති දේපල බදු දීම හා එය පරිහරණය කිරීම එතරම් සුභදායක නොවන බවත් අපි සැවොම සිටින සභාවක මෙම කටයුතු විනිවිදභාවයකින් සිදු කිරීම සුදුසු බව පවසමින් මින් ඉදිරියේ දී මේ ආකාරයට කටයුතු කරන විට සභාවේ කිසිවෙකුටත් චෝදනාවක් එල්ල නොවන ලෙස කටයුතු කිරීම සුදුසු බව පවසමින් සිය අදහස් දැක්වීම නිමා කරන ලදි.

**<u>ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා අදහස් දැක්විම.</u>**

ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා අදහස් දක්වමින් මන්ත්‍රීවරුන් හමුවීමට පැමිණෙන ජනතාව සමඟ කතා කිරීමට ස්ථානයක් නොමැති බැවින් ඒ සඳහා කොවිඩ් මධ්‍යස්ථානය නැවත ලබා දෙන ලෙසත් ඕනෑම ආණ්ඩුවකට චෝදනා ඇති බවත් 1977න් පසු සියළු නායකයින් දැනට රටේ පවතින තත්ත්වයට වග කිව යුතු බවත් බැසිල් රාජපක්ෂ මහතා අප ප්‍රාදේශීය සභාවට වාහන සහ ගොඩනැගිලි ලබා දුන් බවත් හොඳ දේ හොඳ බවත් නරක දේ නරක බවත් ප්‍රකාශ කරමින් ජනතාවට යමක් කිරීමට සැවොම එකතු වී කටයුතු කිරීම සුදුසු බව පවසමින් සිය අදහස් දැක්වීම නිමා කරන ලදි.

**<u>ගරු මන්ත්‍රිනී ඩී.එම්. කරුණාවතී මැතිතුමිය අදහස් දැක්විම.</u>**

ගරු මන්ත්‍රිනී ඩී.එම්. කරුණාවතී මැතිතුමිය අදහස් දක්වමින් රැස්වීමේ සිටින සියළු ග්‍රාමීය නායකයින් සියළුදෙනා ග්‍රාමීය ජනතාවට සහනයක් ලබා දෙන ආකාරයට කටයුතු කිරීම සුදුසු බවත් අද රටට ඇති වී ඇති තත්ත්වය තමන්ගේ හිතට තට්ටු කර බලන ලෙසත් රූපවාහිනිය මඟින් එය හොඳට පෙනෙන බවත් එයට භේද බින්න වීමට අවශ්‍ය නොවන බවත් ප්‍රකාශ කළ

අතර අප සියළුදෙනා එකතුවී කටයුතු කලානම් ගැටළුවක් නොමැති බවත් කුසගින්න කාටවත් නතර කළ නොහැකි බැවින් තමන්ගේ පවුල් ස්වයංපෝෂිත කිරීමට තම බල ප්‍රදේශ තුළ නගා සිටුවීමට අවශ්‍ය කටයුතු කළ යුතු බවත් දේශපාලනය සභාවට ගෙන ඒම වැඩක් නොවන බවත් ප්‍රකාශ කරමින් සිය අදහස් දැක්වීම නිමා කරන ලදි.

<u>ගරු සභාපති ජී.ජී.ආර්. සිල්වා මැතිතුමා</u>

ගරු සභාපති ජී.ජී.ආර්. සිල්වා මැතිතුමා පිළිතුරු කථාව කරමින් ගරු කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් පවසන ලද කාරණය සම්බන්ධව ගැටලුවක් ඇති බවත් එහි දී ප්‍රාදේශීය ලේකම්තුමිය සමඟ මෙම ගැටළුව පිළිබඳ සාකච්ඡා කර ක්‍රියාමාර්ගයක් ගැනීම සුදුසු බවත් ග්‍රාමසේවා නිලධාරිගෙන් ගොයම් කපන මැෂින් පිළිබඳ විස්තර රැගෙන ඉන්ධන ලබා දීමට කටයුතු කිරීම සුදුසු බවද පැවසීය.

ගරු මන්ත්‍රී එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා විසින් පවසන ලද කාරණය සම්බන්ධව එම යෝජනාව විදිමත් යෝජනාවක් ලෙස ඉදිරිපත් කරන ලෙසත් එසේ සිදු කිරීමෙන් පසු කාර්මික නිලධාරිතුමියගෙන් මිල ගණන් කැඳවිය හැකි බවත් පැවසීය.

ගරු මන්ත්‍රී එච්.එම්. සරත් කුමාර මැතිතුමා පවසන කාරණය සම්බන්ධව මෙය ප්‍රාදේශීය සභාවට අයිති දේපලක් නොවන බවත් දිගින් දිගටම මෙම ස්ථානයේ සිටින අය තාවකාලික බදු ක්‍රමයට හෝ තාවකාලික ගිවිසුමක් යටතේ ලබා දෙන ලෙස ඉල්ලීම් කළ අතර අපට අයිති නොවන දේපලක් නිසා එය විදිමත් ලෙස ප්‍රසම්පාදනය කළ නොහැකි බවත් නගරයේ ඉඩම් කළමනාකරණය කිරීම යන පදනම මත තාවකාලිකව බදු දීමටත් එම ස්ථාන අපවිත්‍ර වීම අවම කිරීමටත් සභාව විසින් පවසන ඕනෑම වෙලාවක ගලවා ඉවත් කිරීමේ පදනම මතත් කී මනි මුදලක් හා මාසික ගාස්තුවක් අයකරගෙන ලබා දීමට කටයුතු කර ඇති බව ප්‍රකාශ කරන ලදී.

රටේ අර්බුදකාරී තත්ත්වයට අද වන විට සැවොම මුහුණ දෙන අතර මෙය එක් අයෙකුට පමණක් භාර දිය නොහැකි බවත් රටට ගැලපෙන හා නොගැලපෙන තීරණ ගැනීම නිසා අද මෙම තත්ත්වයට මුහුණ දීමට සිදු වී ඇති බවත් අපනයනය වැඩි කර ආනයනය අඩුකලා නම් ගෙවුම් ශේෂ හිඟය නැති වන බවත් මේ සඳහා යුද්ධය හා ස්වාභාවික උපද්‍රව බලපෑ ඇති බවත් ශ්‍රී ලාංකිකයන් ලෙස එය විඳදරාගෙන වියදම් අවම වන ආකාරයට කටයුතු කරන ලෙසත් පක්ෂ භේද නොතකා සියළු දෙනාටම එන්නත්කරණය ලබා දුන් බවත් මෙම ගැටළුව ණය ලබාගෙන හෝ විසඳිය යුතු අතර කුමන නායකයා පත් වුවත් ඔහුට ණය වාරික ගෙවීමට සිදුවන බවත් වැටුන වලෙන්ම ගොඩ ඒමට සිදුවන බවත් ප්‍රකාශ කරමින් සිය පිළිතුරු කථාව නිමා කරන ලදි.

මීළඟ මාසික සභාව 2022 අප්‍රේල් මස 21 වන බ්‍රහස්පතින්දා පෙරවරු 9.30ට ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදි පැවැත් වීමට තීරණය කරමින් සභාවේ වැඩකටයුතු අවසන් කරන ලදි.

ජී.ජී.ආර්. සිල්වා,
සභාපති,
බිබිල ප්‍රාදේශීය සභාව.

ජී.ජී.ආර් සිල්වා
සභාපති
බිබිල ප්‍රාදේශීය සභාව

පිටපත්

01. ඌව පළාතේ පළාත් පාලන කොමසාරිස්, බදුල්ල. - කා.දැ.ගැ.පි.

02. පළාත් පාලන සහකාර කොමසාරිස්, මොණරාගල. - කා.දැ.ගැ.පි.

03.විගණන අධිකාරී, ජාතික විගණන උප කාර්යාලය, හුලංදාව,මොණරාගල- කා.දැ.ගැ.පි.